ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/08/31 |

## 2015 අගෝස්තු මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, 2015 අගෝස්තු මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත පසුගිය මාසයේ වාර්තා කළ සියයට -0.2 හි නොවෙනස්ව පැවතිණි. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 ජූලි මස පැවැති සියයට 1.3 හි සිට 2015 අගෝස්තු මාසයේ දී සියයට 1.0 දක්වා පහළ වැටිණි.



කො.පා.මි.දර්ශකය 2015 ජූලි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා සියයට 0.5 කින් පහළ ගියේය. දර්ශකයේ මෙම පහළ යෑම කෙරෙහි ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් පහළ යෑම හේතු විය. සමහර එළවළු වර්ග, පොල්, පොල්තෙල්, සහල්, අමු මිරිස්, මත්ස්‍ය වර්ග, අර්තාපල් සහ රතු ළූනු ආදියෙහි මිල ගණන් 2015 අගෝස්තු මාසයේ දී පහළ ගියේය. කෙසේ වුවද, හාල්මැස්සන්, බිත්තර, සමහර පළතුරු වර්ග සහ ලොකු ළූනු ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ, රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේය. 2015.07.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි එල්.පී.ගෑස් මිල පහළ දැමීමෙහි සමස්ත බලපෑම අගෝස්තු මස සිට අදාළ වීම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයේ පහළයාමක් වාර්තා විය. සෞඛ්‍ය; ප්‍රවාහන; සන්නිවේදන; සහ විනෝදාත්මක හා සංස්කෘතික උප කාණ්ඩ මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2015 ජූලි මස පැවති සියයට 3.5 හි සිට 2015 අගෝස්තු මාසයේ දී සියයට 3.9 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය අඛණ්ඩව තුන්වන මාසයටත් සියයට 2.8 හි නොවෙනස්ව පැවතිණි.